තලවාකැලේ - ලිඳුල නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 පෙබරවාරි 29 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 15 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ - ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-----------------------------------------

1.3.1 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 එකතුව රු.15,142,563ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.7,602,995ක් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.9,595,206ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.8,422,796ක් වී තිබුණි.

1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්
------------------------------

මුදල් පොතේ ශේෂය සහ බැංකු ප්‍රකාශයේ ශේෂය අතර දිගින් දිගටම පැවති රු.410,726ක නොසැසඳීමක් අනාවරණය කර ගැනීමකින් තොරව පැවැතුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

(අ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.116,092ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වලින් වසර 03 සිට 12ක කාල පරාසයක් වෙනුවෙන් ව්‍යාපෘති 08ක් සඳහා ලැබිය යුතු මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.1,064,602ක මුදල තව දුරටත් ලැබිය හැකි බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,486,183ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,466,729ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,019,454ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ 4,019,454ක වර්ධනයට ආදායම් විෂයයන් 04ක වැඩිවීම සහ වියදම් විෂයයන් 03ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | | | 2015.12.31 දිනට හිඟ | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2015.01.01 දිනට පැවති හිඟයෙන් | වර්ෂයේ බිල්කිරීම් වලින් | මුළු හිඟය |
| | | | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 3,393,673 | 1,698,403 | 6,622,063 | 5,244,400 | 1,695,270 | 1,377,633 | 3,072,903 |
| කඩ කුලී | 551,251 | 284,027 | 3,024,283 | 2,744,845 | 267,224 | 279,438 | 546,662 |
| වෙනත් | 64,203 | 3,464 | 3,549,522 | 3,300,175 | 60,739 | 249,345 | 310,084 |

i. <u>වරිපනම් බදු</u>
හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව දේපළ තහනමට ගැනීම සිදුකර නොතිබුණි.

ii. <u>කඩකුලී</u>
කිසියම් කඩ කාමර බදු කරුවෙකු මාස 03කට වඩා කුලී ගෙවීම පැහැරහරින අවස්ථාවලදී ගිවිසුම් ප්‍රකාරව දේපල ආපසු පවරා ගතයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3.2 ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු

සභාවේ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට රු.50 බැගින් වර්ග අඩි 2378ක් වෙනුවෙන් අයකළ යුතු රු.118,625ක ගාස්තු අයකර නොතිබුණි.

2.3.3 තානායම් කුලී

--------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාව සතුව තිබූ තානායම ඉහළ කොත්මලේ ව්‍යාපෘතිය ඉදිකිරීමේදී ඉවත්කිරීම හේතුවෙන් නව තානායම ඉදිකරන තුරු ගිවිසුම් ප්‍රකාරව එම ව්‍යාපෘතියෙන් සභාවට ලැබිය යුතු රු.2,629,962ක මුදලක් ලැබී නොතිබුණි.

(ii) සභාව සතු තානායම මාසිකව රු.251,000ක කුලියකට බාහිර පාර්ශවයකට ලබාදී තිබුණු නමුත් ගිවිසුමේ කොන්දේසි අනුව මත්පැන් බලපත්‍රය ලබාදීමට නොහැකිවීම හේතුවෙන් මසකට රු.100,000ක් බැගින් කුලිය අඩුකිරීමට සිදුවීම නිසා 2015 වර්ෂය වෙනුවෙන් සභාවට රු.1,200,000ක ආදායමක් අහිමිවී තිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

2015 දෙසැම්බර් 31 දිනට 1,285,000ක මුද්දර ගාස්තු සහ රු. 131,543ක උසාවි දඩ ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බණ්ඩාරනායක චතුරශ්‍රය ඉඩම බදුදීම

------------------------------------------

1955 නොවැම්බර් 09 දින අංක L-334 දරන පැවරුම් නියෝගය මඟින් කුඩා ප්‍රමාණයේ ආදර්ශ නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා සභාවට පැවරී තිබුණු තලවකැලේ බණ්ඩාරනායක චතුරශ්‍රයේ පිහිටි පර්චස් 12.34ක ඉඩම් කොටස පැවරුම් නියෝගයේ කොන්දේසි සහ නගර සභා ආඥා පනතේ 33 (iii) වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව මහල් තුනකින් යුත් සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා වසර 03ක කාලයකට රු.2,639,998ක මුදලකට බදුදී තිබුණි. තවද බදුකරු තෝරාගැනීම සඳහා විනිවිද භාවයෙන් යුත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ආ) මිඩ්ල්ටන් ආහාර අලෙවි මධ්‍යස්ථානය ඉදිකිරීම

---------------------------------------------

පළාත් නැඟුම වැඩසටහන යටතේ රු.3,044,567ක් වැයකරමින් ඉදිකළ ඉහත ගොඩනැගිල්ල පිහිටි ඉඩම සභාව වෙත පවරාගෙන නොතිබුණි.

(ඇ) මිඩ්ල්ටන් සංචාරක ගිමන්හල බදුදීම

------------------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් රු.1,746,818ක් වැයකර ඉදිකර තිබුණු මෙම ගිමන්හල පිහිටි භූමියේ අයිතිය සභාව විසින් තහවුරු කරගෙන නොතිබුණු අතර භූමියේ හිමිකම සඳහා බාහිර පාර්ශවයන් විසින් අංක L 1676 දරන නඩුව නුවරඑළිය දිසා අධිකාරණයේ පවරා තිබුණි. එම හේතුව මත සභාව මෙම ස්ථානය මාසිකව රු.30,000ක කුලියකට දීමට ගිවිසුම් අත්සන්කර තිබුණද, ලබාගත් තැන්පත් මුදල වූ රු.290,000ද ආපසු ගෙවීමට සිදුව තිබුණි.

(ඉ) ආදාහනාගාර නඩත්තු හා සේවා

---------------------------------

ආදාහනාගාරයේ නඩත්තු හා සේවා සඳහා ඉදිකිරීම් සිදුකළ ආයතනය සමඟ සේවා ගිවිසුමකට එළඹ නොතිබුණු අතර 2016 මාර්තු 15 දින වන විට ආදාහනයන් 100කට වැඩි ප්‍රමාණයක් සිදුකර තිබුණද, සේවා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

ඉහළ කොත්මලේ ජලාශය තුළ විනෝදාත්මක බෝට්ටු සේවාවක් පවත්වාගෙන යාම වෙනුවෙන් බෝට්ටු මිලදීගැනීම සහ ජැටිය ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේ රු.926,900ක වියදමක් දරා තිබූ අතර ජලාශය භාවිත කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ එළඹි ගිවිසුම අනුව රු.120,000ක මුදලක් වාර්ෂිකව ලංකා විදුලි බල මණ්ඩලය වෙත ගෙවා තිබුණි. එහෙත් අදාළ ව්‍යාපෘතිය 2016 මාර්තු 15 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------

(අ) 2006 වර්ෂයේ රු.131,450 කට මිලදී ගෙන තිබූ කසල කැබලි කරන ඇග්‍රිටෙක් මල්ටි චොපර් යන්ත්‍රය මිලදීගෙන වසර 08ක කාලයක් ඉක්මවා ගොස් ඇතත් 2015 දෙසැම්බර් 31 දින තෙක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යයව තබා තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ ලද ආධාර, පළාත් නිශ්චිත ප්‍රතිපාදන හා සභා අරමුදල් යොදවා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.6,800,937ක වියදමක් දරා ඉදිකර තිබුණු කොම්පෝස්ට් අංගනයේ මෙහෙයුම් කටයුතු ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

3.4 පාරිසරික ගැටළු

------------------

සභාවේ ගලිරථය යොදවා මලාපවහනය වෙනුවෙන් 2015 වර්ෂය තුලදී රු.1,442,170ක ආදායමක් උපයා තිබුණි. ගලිරථයේ සේවය සභා බලප්‍රදේශයෙන් පිටතටද විශාල වශයෙන් ලබාදී තිබූ අතර වර්ෂය තුළ ගලි පිරවුම් 200කට අධික සංඛ්‍යාවක් බැහැරකර තිබුණද, මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ඒකකයක් සභාව සතුව නොතිබීම හේතුවෙන් ගෙන එනු ලබන මල අපද්‍රව්‍ය සභාවේ අපද්‍රව්‍ය බැහැර කරන අංගනයට බැහැර කරමින් පැවතුණි.

අපද්‍රව්‍ය අංගනයේ බැසයන අපජලය පවිත්‍ර කිරීම සඳහා ඉහළ කොත්මලේ විදුලි ව්‍යාපෘතිය මඟින් ඉදිකරදී තිබුණු අප ජල පවිත්‍රකරණ ඒකකය (Treatment Plant) අතහැර දැමීම හේතුවෙන් විනාශවී තිබුණු අතර ඒ හේතුවෙන් සියළු අපජලය වැස්සත් සමඟ කොත්මලේ ඔයට ගලායෑමේ අවදානමක් පැවතුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

---------------------------------------

4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 06ක සියයට 07සිට සියයට 62 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 12 සිට සියයට 145 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය